# විකාශණ නියාමන කොමිෂන් සභා කෙටුම්පත

## 2023 මැයි

**සාකච්ඡාව සඳහා ඉදිරිපත් කර ඇති විද්‍යුත් විකාශණ නියාමනය කොමිෂන් සභා කෙටුම්පත පිළිබඳ නිරීක්ෂණ, විවේචන සහ සංශෝධන සඳහා යෝජනා**

MEDIA
LAW
FORUM

මාධ්‍ය
නීති
සංසදය

## පසුබිම

විද්‍යුත් විකාශණ නියාමනය සඳහා නීති සම්පාදනය කළ යුතු බවට වන යෝජනාවක් ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලය වෙත යොමුකල අතර එය 2022 සැප්තැම්බර් 9 දින කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරන ලදී. ඒ අනුව අධිකරණ අමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් ඒ සඳහා කැබිනට් අනුකමිටුවක් පත් කර ලදී. එකී කැබිනට් අනුකමිටුව විසින් සකස් කරන ලද කෙටුම්පත ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් විද්‍යුත් විකාශකයන්ගේ සංගමය වෙත අදහස් ලබාදීම සඳහා යොමුකර ඇත.

## විද්‍යුත් විකාශනයන් නියාමනය සඳහා කොමිෂන් සභාවක් අවශ්‍යද?

ගුවන් විදුලි සහ ටෙලිවිෂන් යන විද්‍යුත් විකාශනයන් පිළිබඳව දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාවට පවතී. මෙම විකාශණයන් සඳහා අවශ්‍ය ගුවන් විදුලි තරංග වෙන් කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ.

නමුත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 44 වගන්තිය අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හැර වෙනත් ගුවන් විදුලි විකාශණයක් පවත්වාගෙන යාම සඳහා ජනමාධ්‍ය අමාත්‍යවරයාගෙන් ලබාගත් විකාශණ බලපත්‍රයක් තිබිය යුතුය. එසේම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 28 වගන්තියට අනුව ශ්‍රී ලංකා රූපවාහිනිය හැර වෙනත් ටෙලිවිෂන් විකාශණයක් පවත්වාගෙන යාම සඳහා ජනමාධ්‍ය අමාත්‍යවරයාගෙන් ලබාගත් විකාශණ බලපත්‍රයක් තිබිය යුතුය.

විකාශණ තරංග වෙන් කිරීම සඳහා ආයතනයක් මෙන්ම විකාශණ බලපත්‍ර ලබාදීමට ආයතන පැවතියද විද්‍යුත් මාධ්‍ය විකාශනයන්හි අන්තර්ගතය නියාමනය සඳහා බලය පැවරුණ ආයතනයක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත හෝ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත මගින් නිර්මාණය කර නොමැත. එබැවින් විද්‍යුත් විකාශනයන්ගේ අන්තර්ගතය නියාමය සඳහා බලය පැවරුණ ආයතනයක අවශ්‍යතාවය මතුව පවතී.

පුවත්පත් මාධ්‍යයන්ගේ අන්තර්ගතය නියාමනය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩය ස්ථාපනය කර ඇති අතර ඒ සඳහා එල්ලවන ප්‍රධානම චෝදනාව වන්නේ එය ස්වාධින නොවන සහ මාධ්‍ය සමාජයේ ප්‍රමාණවත් නියෝජනයක් සහිත ආයතනයක් නොවීමයි. එබැවින් විද්‍යුත් මාධ්‍ය නියාමනය සඳහා වන ආයතනයද ස්වාධින ආයතනයක් විය යුතය. විශේෂයෙන්ම රජය සහ විද්‍යුත් මාධ්‍යයේ සියලු පරදු පාර්ශවයන් නියෝජනය වන ආයතනයක් විය යුතු අතර එය රාජ්‍ය මැදිහත්වීමක් සහිත සහ නියාමන ආකාරයේ නියාමන ආයතනයක් විය යුතුය.

## කෙටුම්පත මගින් සිදුකිරීමට යෝජිත කාර්යයන්

- විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභාවක් ස්ථාපනය කරීම.
- දැනට පවතින සියලුම විද්‍යුත් විකාශණ මාධ්‍ය ආයතන නැවත විකාශන බලපත්‍ර ඉල්ලීමේ ක්‍රියාවලියකට යොමු කිරීම.
- විද්‍යුත් විකාශන අන්තර්ගතය නියාමනය යෝජිත කොමිසම මගින් සිදුකිරීම.
- සෑම බලපත්‍රලාභි විද්‍යුත් විකාශණ ආයතනයක්ම වාර්ෂික බලපත්‍ර අලුත් කිරීමක් සඳහා ඉල්ලුම් කරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- විද්‍යුත් විකාශන ආයතනවල අන්තර්ගතය පරීක්ෂා කරීමට පැමිණිලි විමර්ශණ කමිටුවක් පත් කිරීම (19 වගන්තියේ සිට ඉදිරියට)
- විද්‍යුත් විකාශණ ආයතනවල බලපත්‍ර අත් හිටුවීමට හෝ අහෝසි කිරීමට යෝජිත කොමිෂන් සභාවට බලය පැවරීම.
- විෂය භාර අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව සමග බලපත්‍ර නිකුත් කිරීමට අදාල නියෝග පැනවීමට අදාල ප්‍රතිපාදන ස්ථාපනය කිරීම
- කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධ විධිවිධාන සඳහා කොමිෂන් සභාවට රීති පැනවීමට බලය පැවරීම
- දඩ සහ සිර දඬුවම් නියමකල හැකි වැරදි හඳුන්වාදීම

## කෙටුම්පතේ පවතින විද්‍යුත් විකාශන කර්මාන්තයට සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට පටහැනි ප්‍රතිපාදන

### පනත මගින් රාජ්‍ය නියාමනයක් යෝජනා කර තිබීම

රාජ්‍ය විසින් මාධ්‍ය නියාමනය කිරීම වර්ථමානයේ පිළිගන්නා ක්‍රමවේදයක් නොවේ. මාධ්‍ය නියාමනයේ සාර්ථකම ක්‍රමවේදය ලෙස පිලිගන්නේ සහ-නියාමන ක්‍රමවේදයයි. එනම් රාජ්‍ය සහ මාධ්‍ය සමාජය විසින් එක්ව නියාමනය සිදුකිරීමයි. නමුත් මෙම පනත් කෙටුම්පත මගින් යෝජනා කරන්නේ රාජ්‍ය නියාමන ක්‍රමවේදයකි.

### කොමිෂන් සභාව ස්වාධින නොවීම

කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු නිලබලයෙන් පත්වේ. ඔවුන් එම නිලතලවලට පත්වන්නේ ජනාධිපතිගේ පත් කිරීම් මතය. ඔවුන් අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමේ බලයද ජනාධිපතිට පවතී. එබැවින් එම නිලධාරීන් ස්වාධින පුද්ගලයන් නොව පවතින ආණ්ඩුවේ අරමුණු අනුව කටයුතු කරන පුද්ගලයන් වේ. පත්කරන සාමාජිකයන් තිදෙනා පත් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසිනි. ඒ අනුව පනතේ දක්වන සුදුසුකම් ඇති ඕනෑම පුද්ගලයන් තිදෙනෙකු නිර්දේශ කිරීමේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පවතී.

එසේම කොමිෂන් සභාවේ ස්වාධිනත්වයට පවතින තවත් ප්‍රධානම බාධාවක් නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට දැනුම්දීමෙන් අනතුරුව කොමසාරිස්වරුවන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට පැවතීමයි.

එමෙන්ම අධ්‍යක්ෂක ජෙනරාල්වරයා පත් කිරීම විෂය භාර අමාත්‍යවරයා විසින් සිදුකිරීමද කොමිෂන් සභාවේ ස්වාධිනත්වයට බාධාවකි.

එසේම කෙටුම්පතේ 25 වන වගන්තියට අනුව කොමසාරිස්වරුන්ගේ දීමනාවන් තීරණය කිරීමේ බලය විෂය භාර අමාත්‍යවරයාට පවරා ඇත. එසේ කෙටුම්පතේ 26 වන වගන්තියට අනුව කොමිෂන් සභාව වෙත විශේෂ සහ සාමාන්‍ය විධාන නිකුත් කිරීමට බලයද විෂය භාර අමාත්‍යවරයාට ලබාදී තිබේ. මෙම ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්වාධිනත්වයට බාධාවකි. කෙටුම්පතේ සමස්ථ ප්‍රතිපාදන සැලකීමේදී කෙටුම්පත මගින් යෝජනා කරන මාධ්‍ය නියාමන කොමිසම ස්වාධින කොමිසමක් නොව ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යවරයා යටතේ ක්‍රියාත්මක වන කොමිෂන් සභාවකි.

### විකාශණ බලපත්‍රලාභි ආයතනවල අනාගතය සුරක්ෂිත නොවීම

කෙටුම්පතේ දක්වන ආකාරයට පනත ක්‍රියාත්මක වීමෙන් මාස තුනකින් පසුව දැනට විකාශණ කටයුතු සිදුකරන සියලුම විකාශණ ආයතන මෙම පනත යටතේ බලපත්‍ර ලබාගැනීම සඳහා ඉල්ලුම්කල යුතුය. දැනට විකාශණ කටයුතු කරන ආයතනවල විකාශණ බලපත්‍ර නව පනත යටතේ ලැබේද යන්න පිලිබදව තහවුරුවක් කෙටුපම්පතේ නොමැත. එබැවින් දැනට ක්‍රියාත්මක වන විකාශණ ආයතනවල අනාගතය අවිනිශ්චිත කර ඇත.

### වාර්ෂික බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රමවේදය

කෙටුම්පත මගින් වාර්ෂිකව විකාශණ බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රමයක් පිලිබදව ප්‍රතිපාදන ඇතුලත් කර ඇත. ඒ අනුව වාර්ෂිකව බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉල්ලුම්කල විකාශන ආයතනයක බලපත්‍ර අලුත් කිරීම සිදු නොකලහොත් එම විකාශණ ආයතනයේ විකාශණ කටයුතු නැවැත්වීමට සිදුවන අතර එමගින් විශාල ප්‍රාග්ධණයක් යොදා සිදුකල ව්‍යාපාරය නැවැත්වීමට සිදුවේ. එසේම එහි සේවය කල සේවකයන්ගේ රැකියාවන්ද නිමාවට පත් වේ. ඒ අනුව මෙම පනත ක්‍රියාත්මක වුවහොත් ඉදිරියේදී විද්‍යුත් මාධ්‍ය ආයතනයකට සේවකයන් බදවා ගැනීමේදී වාර්ෂික පදනම මත සේවකයන් බදවා ගැනිමට සිදුවේ.

### ආචාරධර්ම පද්ධතිය සකස් කරන ක්‍රමය

පනතේ 5(l) වගන්තියට අනුව කොමිෂන් සභාව විසින් ආචාරධර්ම සකස් කරනු ලබන්නේ බලපත්‍ර ලාභි විකාශණ ආයතන වෙතින් උපදෙස් ලබාගැනීමෙන් පසුවය. නමුත් විද්‍යුත් මාධ්‍ය සඳහා ආචාරධර්ම පද්ධතියක බලපෑම විද්‍යුත් මාධ්‍යවේදීන්ටද සෘජුවම බලපාන බැවින් ඔවුන් මෙම ක්‍රියාවලියෙන් බැහැරකර තිබීම අඩුපාඩුවකි.

### ඇතැම් වචන නිර්වචනය කර නොතිබීම සහ ඒවා පිළිබඳව කොමිසමේ මතය පමණක් බලාත්මක වීම

පනතේ 5(න) වගන්තියට අනුව විකාශන ආයතන විසින් සිදුකරනු ලබන විකාශනයන් ජාතික ආරක්ෂාවට නීතිය සහ සාමය හා ජාතික ආර්ථිකයට හානියක් නොවන බවට වගබලාගැනීම කොමිෂන් සභාවේ අරමුණක් ලෙස දක්වා ඇත. මෙම වචන අර්ථ නිරූපනයක්ද ලබාදී නැති බැවින් මෙම ගින් කොමිෂන් සභාවට පවරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 14(1)(අ) ව්‍යවස්ථාවන්ට පටහැනි ලෙස භාවිතා විය හැකිය.

### පැමිණිලි විමර්ශණ කමිටුවට ලබාදී ඇති ඇතැම් බලතල

පැමිණිලි විමර්ශණ කමිටුවට ලබාදී ඇති බලතල අපරාධ විමර්ශණ බලතල වලට සමාන වන අතර අපරාධමය නොවන කාර්යයක් සඳහා එවැනි බලතල ලබාදීමක් සුදුසු නොවේ. අපරාධ වරදක් සිදුවන අවස්ථාවකදී ඒ පිළිබඳව අපරාධ වැරදි සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීතියෙන් බලය ලබාදී ඇති ආයතන වෙත පැවරීම සුදුසුය.

එසේම විකාශණයක් අත් හිටුවීමට හෝ බලපත්‍රය අහෝසි කිරීමට කොමිෂන් සභාවට නිර්දේශ කිරීමට පවතින බලතලද ඉතා පළුල්ය(19(7)වගන්තිය). විශේෂයෙන්ම ජාතික ආර්ථිකයට අගතිදායක යමක් විකාශණය කල බවට කමිටුවේ සහ කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවකදී බලපත්‍රයක් අත් හිටුවීම හෝ අහොසි කිරීම සිදුකල හැකිය. ජාතික ආර්ථිකයට හානිදායක අන්තර්ගතයක් විකාශණය කිරීම යන්න නිශ්චය කිරීම ඉතා පුලුල් කටයුත්තක් බැවින් රජයේ ආර්ථික පිලිවෙත විවේචනය කරන විකාශණ ආයතන මර්ධනය කිරීමට බලයක් මෙම ප්‍රතිපාදන මගින් සැලසී ඇත

## යෝජිත කෙටුම්පත සම්බන්ධයෙන් සිදුකරන යෝජනා

### සහ නියාමන යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම

ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුතුව ස්වාධින නියාමනයක් සඳහා යුරෝපා කවුන්සලයේ අමාත්‍ය කමිටුව (Council of Europe Committee of Ministers) විසින් 2000 වර්ෂයේදී අනුමත කරන ලද විකාශන අංශය සඳහා නියාමන අධිකාරීන්ගේ ස්වාධීනත්වය සහ කාර්යයන් පිළිබඳ මාර්ගෝපදේශ (Guidelines concerning the independence and functions of regulatory authorities for the broadcasting sector)[1] පාදක කරගත් සහ නියාමන යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.(ඇමුණුම් 1 බලන්න)

### කොමිෂන් සභාව ස්වාධින කිරීම

- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් පත් කරන ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් විවිධ සංවිධානවලින් නාමයෝජනා කැඳවීමෙන් පසුව තෝරාගන්නා පුද්ගලයන් කොමිෂන් සභාවට නිර්දේශ කරන ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- කොමිෂන් සභාවේ සියලු නිලධාරීන් පත් කිරීමේ බලය කොමිෂන් සභාවට ලබාදීම.
- කොමසාරිස්වරුන්ගේ දීමනා තීරණය කිරීමේ බලය පාර්ලිමේන්තුවට පැවරීම.
- කොමසාරිස්වරුන් ඉවත් කිරීමේදි පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත වන යෝජනාවක් මගින් ජනාධිපතිවරයාට බලය පැවරෙන පරිදී ප්‍රතිපාදන ඇතුලත් කිරීම.
- කොමිෂන් සභාව ජනමාධ්‍ය අමාත්‍යංශය යටතේ පවතින ආයතනයක් නොව වෙනම වැය ශීර්ශයක් සහිත ආයතනයක් බවට පත් කිරීම සහ කොමිසමේ සභාපතිවරයා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා බවට පිළිගැනීම.
- දැනට විකාශන බලපත්‍ර ලබාගෙන විකාශණ කටයුතු සිදුකරන විකාශණ ආයතන සඳහා නව පනත යටතේ බලපත්‍ර අනිවාර්යයෙන් බලපත්‍ර ලැබෙන බවට සහතික වන ප්‍රතිපාදන ඇතුලත් වීම
- වාර්ෂික බලපත්‍ර අලුත්කිරීමේ ප්‍රතිපාදන ඉවත් කිරීම
- බලපත්‍ර අත් හිටුවීම හෝ බලපත්‍ර අහෝසි කිරීමේ පදනමක් ලෙස ජාතික ආර්ථිකයට අගතිදායක වන විකාශණ අන්තර්ගතයන් යන්න ඉවත් කිරීම.
- ආචාරධර්ම පද්ධතිය සකස් කිරීමේදි විද්‍යුත් විකාශණයට අදාල සියලු පාර්ශවයන් සම්බන්ධ කරගෙන එය සිදුකිරීම සඳහා වන ප්‍රතිපාදන ඇතුලත් කිරීම.
- විකාශණ ආයතනවලට මහේස්ත්‍රාත් නියෝග රැගෙන කඩා පැනීමට පැමිණිලි විමර්ශණ කමිටුවට ලබාදී ඇති ප්‍රතිපාදන ඉවත් කිරීම.

1 https://search.coe.int/cm/Pages/result_details.aspx?ObjectId=09000016804e0322 03-06-2023

## සමාප්තිය

විද්‍යුත් විකාශණ මාධ්‍ය නියාමනය යනු ගුවන් විදුලි තරංග වෙන් කිරීමට අදාල කටයුතු නියාමනය සහ විද්‍යුත් විකාශණයන්ගේ අන්තර්ගතය නියාමනය යන කොටස් දෙකින්ම සමන්විත විය යුතු ක්‍රියාවලියකි. නමුත් මෙම කෙටුම්පත මගින් ප්‍රතිපාදන සලසා ඇත්තේ විද්‍යුත් විකාශණයන්ගේ අන්තර්ගතය නියාමනය කිරීම සම්බන්ධයෙන් පමණි. එබැවින් ගුවන් විදුලි තරංග වෙන් කිරීම සඳහා විධිමත් සහ විනිවිද ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. රටක විද්‍යුත් විකාශණ නියාමනය යනු පුරවැසියන්ගේ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිළිබඳ සෘජු බලපෑමක් ඇති කරන කටයුත්තක් බැවින් නියාමනය සම්බන්ධ නීති සකස් කිරීමේ දී එය විවෘත සහ පුළුල් සහභාගීත්වයක් සහිතව සිදුකල යුතුය.

## ඇමුණුම් -1

## සහ-නියාමනය පිළිබඳ පනතක පැවතිය යුතු මූලික මූලධර්ම (මූලිකාංග)

ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුතුව ස්වාධීන නියාමනයක් සඳහා යුරෝපා කවුන්සලයේ අමාත්‍ය කමිටුව (Council of Europe Committee of Ministers) විසින් 2000 වර්ෂයේදී අනුමත කරන ලද විකාශන අංශය සඳහා නියාමන අධිකාරීන්ගේ ස්වාධීනත්වය සහ කාර්යයන් පිළිබඳ මාර්ගෝපදේශ (Guidelines concerning the independence and functions of regulatory authorities for the broadcasting sector)[2] අනාගත ශ්‍රී ලාංකික පනත් කෙටුම්පතක් සඳහාද පාදක කරගත හැකිය.

ඉහතකී මාර්ගෝපදේශයන්හි දැක්වෙන මූලික නීති රාමුව වන්නේ

1 සුදුසු ව්‍යවස්ථාදායක රාමුවක් සැකසීම (ස්වාධීනත්වය තහවුරු කරන නීති රීති හා ක්‍රියා පටිපාටි සැපයීම).

2 නියාමන බලධාරීන්ගේ පත්වීම්, අරමුදල් සහ ඔවුන් වගකිව යුතු ආකාරය ඇතුළු රාජකාරි හා බලතල නිර්වචනය කිරීම.

3 දේශපාලන බලවේගයන්ගේ හෝ ආර්ථික අවශ්‍යතාවන්ගේ මැදිහත්වීමෙන් ආරක්ෂා වීමට නියාමන බලධාරීන් පාලනය කරන රීති ඇතුලත් කිරීම.

4 දේශපාලන බලපෑම් වළක්වා ගැනීම සඳහා ඒවායේ නොගැලපීම් නිර්වචනය කර ඒවා ස්වාධීනව තබා ගත යුතුය.

5 කිසිදු තෙවන පාර්ශවයකින් උපදෙස් ලබා ගැනීමට ඔවුන්ට අවශ්‍ය නොවන පරිදි විධිවිධාන යෙදිය යුතුය. එසේම ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල ස්වාධීනත්වයට අගතියක් විය හැකි ප්‍රකාශයන් අන් අය වැළැක්වීය යුතුය.

6 සේවයෙන් පහ කිරීම දේශපාලන පීඩනයක් ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් නිශ්චිත නීති සම්පාදනය කල යුතුය.

7 අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා අධිකරණයන්ට අභියාචනා පටිපාටියක් අනුගමනය කල යුතුය.

8 නියාමන බලධාරීන් ලෙස ක්ෂේත්‍රයේ විශේෂඥයින් පත් කල යුතුය.

9 නියාමන අධිකාරියට මූල්‍ය ස්වාධිනත්වයක් පිරිනැමීම

10 නියාමන අධිකාරියට බලපත්‍ර ලබාදීම පිලිබද බලතල පිරිනැමීම

11 විකාශකයින් විසින් ඔවුන්ගේ බැඳීම් හා යුතුකම් වලට අනුකූලව කටයුතු කරනාවද යන්න අධීක්ෂණය කිරීමේ බලතල නියාමන අධිකාරියට පැවරීම.

12 නියාමන අධිකාරිය ජනතාවට වගවීම සඳහා නීතිමය ප්‍රතිපාදන ඇතුලත් කර තිබීම.

2 https://search.coe.int/cm/Pages/result_details.aspx?ObjectId=09000016804e0322 03-06-2023

සම්පාදනය - නීතිඥ ජගත් ලියන ආරච්චි

මාධ්‍ය නීති සංසදය
අංක 170, පළමු මහල, අලුත්කඩේ විදිය, කොළඹ 12.
0743070888, 0779522887
prabodha@medialawforum.org
www.medialawforum.org